# විශ්වවිද්‍යාලීය විද්‍යාර්ථියාගේ අධ්‍යයන පරිසරය තුළ ඇති ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයකි (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

**එම්. පී. එන්. පී. මැණික්ගේ[1]**


## සංක්ෂේපය

නව දැනුම බිහි කිරීමේ සහ බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් ලෙස, විශ්වවිද්‍යාලයක් විශිෂ්ට වූ සේවාවක් සමාජයට ඉටු කරනු ලබයි. මෙකී මෙහෙවර තුළින් ඵල නෙලාගැනීම සඳහා විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන්නා වූ විද්‍යාර්ථීන්ගේ ඇතැම් පිරිසකට විවිධ වූ හේතු සාධක මත මෙහිලා පූර්ණ ප්‍රතිලාභය අත්කර ගැනීමට අසමත් වේ. විද්‍යාර්ථයෙකුගේ ඉගෙනුම් ක්‍රියාවලියෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන්නා වූ තීරණාත්මක සාධකයක් වශයෙන් අධ්‍යයන පරිසරය හඳුනා ගත හැකිය. විශ්වවිද්‍යාලයක් තුළින් විද්‍යාර්ථියෙකු ලබන්නේ, නේවාසික අධ්‍යාපනයක් නිසාවෙන් අධ්‍යයන පරිසරය යන්න දේශන ශාලාවට පමණක් සීමා නොවේ. දේශන ශාලාවෙන් පිටත නේවාසිකාගාරය තුළ පුස්තකාලය තුළ පරිසරයද, අධ්‍යයන පරිසරයට අයත් වේ. මෙම අධ්‍යයන පරිසරය තුළ පවතින්නා වූ විවිධ ගැටලුකාරි තත්ත්වයන් විද්‍යාර්ථියාගේ අධ්‍යාපන ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය. මෙම අධ්‍යයනය හරහා උත්සහා දරා ඇත්තේ, විශ්වවිද්‍යාලීය අධ්‍යයන පරිසරය තුළ පවත්නා වූ විද්‍යාර්ථියා මුහුණ දෙන අර්බුදකාරී තත්ත්වයන් හදුනාගැනීම වේ. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගෙන් සසම්භාවී ව තෝරාගත් විද්‍යාර්ථයින් 300 ගෙන් සමන්විත නියැදියක් ආශ්‍රයෙන් ප්‍රශ්නමාලා ක්‍රමය යටතේ, අධ්‍යයනයට අවශ්‍ය ප්‍රාථමික දත්තයන්ද, අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ද්විතියික දත්තයන්ද අධ්‍යයනගේ අරමුණු මත පදනම්ව රැස් කරගනු ලැබී ය. ඒ යටතේ, විද්‍යාර්ථියාගේ අධ්‍යයන පරිසරය තුළ පවත්නා ගැටලුකාරී තත්ත්වයන් මොනවාද යන්නත්, ඒ සඳහා බලපාන සාධක හදුනාගැනීමත්, එම ගැටලු හරහා විද්‍යාර්ථයාගේ ඉගෙනුම් ක්‍රියාවලියට ඇතිකරන බලපෑම කෙසේද යන්න යනාදී අරමුණු මූලික වූ අතර ඒ මත පදනම්ව රැස් කරගනු ලැබූ දත්තයන් සංඛ්‍යානමය විශ්ලේෂණ ක්‍රම යටතේ විශ්ලේෂණය සිදු කෙරිණි. මෙම අධ්‍යයනය අවසානයෙහි අනාවරණය වූයේ, අධ්‍යයනයට බඳුන් වූ නියැදියෙන් 60% ආසන්න විද්‍යාර්ථීන් ප්‍රමාණයකට තම අධ්‍යයන පරිසරය තුළ ගැටලුකාරි තත්ත්වයන් පවතින බවයි. ඒ අතරින් විශේෂයෙන් හදුනාගත් කරුණු අතර නවාතැන් පහසුකම් සම්බන්ධ වූ ගැටලු, ආහාර හා පෝෂණය සම්බන්ධ ගැටලු, විශ්වවිද්‍යාල උප සංස්කෘතිය තුලින් එල්ල වන බලපෑම් සහ විශේෂයෙන්ම භාෂා ගැටලු එනම් ඉංග්‍රීසි භාෂා භාවිතය සම්බන්ධයෙන් පවතින ගැටලු යනාදිය ප්‍රමුඛ කාරණා වශයෙන් අධ්‍යයනය තුළින් අනාවරණය විය.


**මුඛ්‍ය පද :** අධ්‍යයන පරිසරය, විද්‍යාර්ථියා, ගැටලු

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nirmaliprasanthika1@gmail.com